# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 755/7—1993 පෙබරවාරි 24 වැනි බදාදා—1993.02.24

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.බී.—21/78 III.

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වන වගන්තිය සමග කියවිය යුතු ඒ පනතේ 140 වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදන ලද නියමාවලිය.

සී. එස්. කරුණාරත්න මිය,
ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

1993 පෙබරවාරි මස 15 වැනි දින,
කොළඹ දී ය.

නියමාවලිය

1. මේ නියමාවලිය සේවක අධ්‍යාපන ආයතනය (සංශෝධන) නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය 1993 මාර්තු මස 01 වන දින සිට ක්‍රියාත්මක වන්නේය.

2. 1990 දෙසැම්බර් මස 27 වන දින අංක 642/9 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 1990 අංක 07 දරන සේවක අධ්‍යාපන ආයතනය (සංශෝධන) නියමාවලියෙන් සංශෝධිත, 1979 දෙසැම්බර් මස 26 වන දින අංක 68/10 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 1979 අංක 11 දරන සේවක අධ්‍යාපන ආයතනය නියමාවලියේ 11 වන ඡෙදයේ (2) (අ) අනුඡෙදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡෙදය ආදේශ කිරීමෙන් ඒ ඡෙදය මෙයින් වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

> "(අ) ආයතනයේ එක් එක් අධ්‍යයන සභාවේ සාමාජිකයන් අතරින් ඒ එක් එක් සභාව විසින් නම් කරනු ලැබූ ඒ එක් එක් සභාවේ සාමාජිකයන් දෙදෙනෙකු, එසේ නම් කරනු ලැබූ සාමාජිකයන් දෙදෙනාගෙන් එක් සාමාජිකයකු ඒ සභාවේ සභාපතිවරයා විය යුතුය.".

03–125/2


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.